**www.wsws.org**

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කම්කරු දිනය ගැන ඔබාමා: රැකියා අර්බුදය විසඳීමට පියවර ගැනෙන්නේ නැත

## Obama on Labor Day: No measures to address jobs crisis

**2010 සැප්තැම්බර් 7**

එක්සත් ජනපදයේ කම්කරු දිනය සමරන අවස්ථාවේ කතාකල ඔබාමා 1930 ගනන්වල මහා අවපාතයෙන් මෙපිට වඩාත් ම දරුනු රැකියා අර්බුදය ආමන්ත්‍රනය කිරීමට ආන්ඩුව පැත්තෙන් සැලකිය යුතු පියවර ගැනෙන්නේ නැති බව පැහැදිලි කලේ ය.

සඳුදා විස්කොන්සින්හි මිලවුකී දී කතාකරමින් ඔබාමා යටිතල පහසුකම් සහ ප්‍රවාහන ක්ෂේත්‍රවල ආයෝජනය කිරීමේ සැලසුම සැලකිය යුතු රැකියා සම්පාදක වැඩපිලිවෙලක් වනු ඇති බව වගවර්නනා කලේය. මෙම නිවේදනය තොරොම්බල් කිරීමට මාධ්‍ය උත්සාහ දැරුව ද වහා තහවුරු වූයේ සෑම වසර පහකට වරක් ආකාරගතව සම්මත කෙරෙන පනතක් යලි බලාත්මක කරන ලෙස පරිපාලනය කොංග්‍රසයෙන් පුරුදු පරිදි ඉල්ලා සිටින බව යි. වියදම් කිරීම සඳහා ඔබාමා කරන යෝජනාව පසුගිය අවුරුදුවලින් වෙනස් කරනු ලැබ ඇත්තේ මද වසයෙනි.

ධවල මන්දිර දත්ත පත්‍රිකාවකට අනුව ප්‍රවාහන දෙපාර්තමේන්තු වියදම් පනත ඩොලර් බිලියන 50කින් පමන "ඉදිරියෙන් වැඩිකිරීමට" යෝජනා කොට සිටින්නේ එමගින් 2011 තරම් මෑතදී ම රැකියා උත්පාදනය කරනු ඇතැයි කියාපාමිනි. නොවැම්බරයේ පැවැත්වෙන මධ්‍යවාර මැතිවරනය අවසන් වන තෙක් විවාදයට නො ගනු ඇතැයි පෙනෙන එම පනත සඳහා සමස්ත වටිනාකමක් පරිපාලනය පැත්තෙන් යෝජනා කලේ නැත. 2005 දී බුෂ් පරිපාලනය වසර පහක් සඳහා ඩොලර් බිලියන 286.4ක ප්‍රවාහන පනතකට අත්සන් තැබුවේ වසරකට යන්තම් ඩොලර් 50ට අඩු ප්‍රමානයක් වෙන් කරමිනි. මෙම මුදල් ප්‍රාන්ත සහ ප්‍රාන්ත ආන්ඩුවලට වෙන් කරන්නේ මහාමාර්ග හා යටිතල පහසුකම් ව්‍යාපෘති සහ සාමාන්‍ය නඩත්තුවලට අරමුදල් සැපයීම සඳහා ය.

ඇමරිකානු යටිතල පහසුකම්වල පිරිහුනු තත්වයට සන්සන්දනාත්මකව ඔබාමා විසින් යෝජනා කරනු ලබන මුදල හුදෙක් ප්‍රමානවත් නො වනවා පමනක් නොව එය රැකියා අර්බුදයට ආමන්ත්‍රනය කිරීම ද නො කරයි. ඔබාමා පරිපාලනය ම බොහෝකොට පුද්ගලික සමාගම්වලට බදු සහන සහ මුදල් දීමට පසුගිය වසරේ ගෙන ආ ප්‍රමානවත් නො වන ඩොලර් බිලියන 862 "උත්තේජක" පනතට සාපේක්ෂව එය අවපැහැ ගැන්වෙමින් නො පෙනී යයි.

සෘජු රජයේ බඳවාගැනීමේ වැඩපිලිවෙලක් පසෙකින් තැබුවත් වැඩ වෙනුවෙන් නව ප්‍රධාන උත්තේජක පනතක්වත් නොමැති බව පරිපාලනයේ නිලධාරීහු යලි යලිත් අවධාරනය කොට ඇත. සංගතවල සහ කුඩා ව්‍යාපාරවල බදු සහන දිගුකිරීම ඇතුලත් අතිරේක "රැකියා" පියවර ගනනාවක් මේ සතියේ පසුභාගයේ ඔබාමා විසින් නිවේදනය කරනු ලැබීමට නියමිත ය.

අයවැය සහ මූල්‍ය කප්පාදුවේ තේමාව දිගටම පවත්වාගෙන යමින් මේ සියලු පියවරවලට "හොඳින් ගෙවන" බවට පරිපාලනය පොරොන්දු වී තිබේ. බලශක්ති සමාගම් බදු ගෙවීම් පැහැරහැරීමේ විවිධ ක්‍රම අවසන් කරන්නේ යයි ඉඟි කරන අතරම ආහාර සලාක සඳහා අරමුදල් අඩු කිරීමක් සමග ආ රැකියා විරහිතයන්ගේ ප්‍රතිලාභ අවසන් වරට දිගු කිරීමේ දී කලාක් මෙන් එම ගෙවීම් සමාජ වැඩපිලිවෙලවල් කප්පාදු කිරීම ද අඩංගු කර ගනී.

කිසිදු සැලකිය යුතු රැකියා වැඩපිලිවෙලක් ඔබාමා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම දැනුවත් පන්ති යුද පිලිවෙතක කොටසකි. මූල්‍ය අර්බුදයෙන් සහ බැංකුවලට ඩොලර් ට්‍රිලියන ගනනක ඇප තැබීමෙන් දෙවසරකට පසුව කම්කරුවන්ට නව මහජන විරැකියාවේ "නව සාමාන්‍යය" යටතේ අඩු වැටුප්, දීර්ඝ වැඩ පැය සහ වඩා කෲර සේවා කොන්දේසි පිලිගැනීමට බලකරමින් පරිපාලනය කම්කරු පන්තිය සූරාකෑම තියුනු ලෙස උග්‍ර කිරීමේ උද්ඝෝෂනයක මූලිකත්වය ගනිමින් සිටී.

අගෝස්තුවේ රැකියා 54,000ක් නැතිවී යාම පෙන්නුම් කරන නවතම රැකියා වාර්තාව හිස් ආකල්පය ඉස්මතු කර දක්වයි. රැකියා විරහිත කම්කරුවන්ගේ සංඛ්‍යාව යෝධ ලෙස අඩුතක්සේරු කරන නිල විරැකියා අනුපාතය අවම වසයෙන් 2011 වසර පුරා සියයට 10 මට්ටමේ රැඳී තිබේ යයි අපේක්ෂිත ය. නිල වසයෙන් රැකියා විරහිතව සිටින මිලියන 15න් සියයට 42ක් පමන මාස හයකට වඩා රැකියා විරහිතව සිට

ඇත්තේ මිලියන ගනනකට තම සොච්චම් විරැකියා ප්‍රතිලාභ අහිමි වී යද්දී ය.

පරිපාලනය සතුව රැකියා පිලිවෙතක් තිබෙන්නේ යම්තාක් දුරකට ද යත් එය එක්සත් ජනපද කම්කරුවන් සහ මුර්ග ලෙස සූරාකැවෙන ඔවුන්ගේ ආසියානු සගයන් අතර පරතරය වසා දැමීමේ පදනම මත එක්සත් ජනපද නිෂ්පාදන ක්ෂේත්‍රයේ අංශයක් පුනර්ජීවනය කිරීම ඉලක්ක කරගනී. දැනටමත් ඇමරිකානු කම්කරු පන්තිය සූරාකෑමේ මට්ටම සැලකිය යුතු ලෙස ඉහල ගොස් ඇත. දශක ගනනාවක් තුල තියුනු ම අනුපාතවලින් සමාගම්වල ශ්‍රම පිරිවැය වියදම් පහත වැටී ඇත්තේ කම්කරුවන්ට වඩා අඩු දෙයක් වෙනුවෙන් උපරිමව වැඩ කිරීමට බලකරමින් ඵලදායකත්වය ඉහල දමමිනි.

ඔබාමාගේ මෝටර් රථ කාර්ය සාධක බලකායේ ප්‍රධානත්වයට පත් වෝල් වීදියේ ආයෝජක ස්ටීවන් රැට්නර් විසින් වහා නිකුත් කිරීමට නියමිත වාර්තාවකට අදහස් දැක්වූ ඉතාලියානු ෆියට් මෝටර් රථ සමාගමේ ප්‍රධානී සර්ජියෝ මාකියෝන් සංගත ප්‍රභූවේ මතය සංක්ෂිප්තව පලකලේ ය. රැට්නර් පවසන පරිදි එවකට එක්සත් මෝටර් කම්කරු සමිතියේ (යූඒඩබ්ලිව්) සභාපති රොන් ගෙටල්ෆින්ගර්ට මාකියෝන් පවසා තිබුනේ කම්කරුවන් "හිමිකමේ සංස්කෘතියක්" වෙනුවට "දිලිඳු බවේ සංස්කෘතියක්" පිලිගත යුතු බව ය. කම්කරුවන් යෝධ සංගත සහන සහ රැකියා කප්පාදුවක් පිලිගත යුතු යයි ඒ වනවිට බලකරමින් සිටි ක්‍රයිස්ලර් සමාගම සමග ෆියට් සමාගම හවුල්කාරීත්වයක් පිලිබඳව සාකච්ඡා කරමින් සිටියේ ඔබාමා පරිපාලනයේ මග පෙන්වීම යටතේ ය.

කම්කරුවන් "දිලිඳු බවේ සංස්කෘතියකට" යටත් විය යුතු ය යන අධිෂ්ඨානය දේශපාලන පක්ෂ දෙක ද දැනට එවැනි "සංස්කෘතියක්" ඉන්දියානාපොලිස් කම්කරුවන් මත පැටවීමට තමන්ට හැකි සියල්ල කරන යූඒඩබ්ලිව් සමිතිය ද බෙදාහදා ගනිති.

එක්සත් ජනපදය තුල කම්කරු දිනය සැමවිට ම පන්ති අරගලය සමහන් කිරීම ඉලක්ක කරගනී. එය ඇමරිකානු කම්කරුවන්ව ලෝකය පුරා ඔවුන් හා සමාන කොන්දේසිවලට මුහුන දෙන සිය පන්ති සහෝදර සහෝදරියන්ගෙන් වෙන්කිරීමේ දැනුවත් උත්සාහයක් තුල මැයි 1දාට යෙදෙන ජාත්‍යන්තර කම්කරු දිනයට ආදේශකයක් ලෙස නිපදවා ගන්නා ලදී. මෙම දිනය ඇමරිකානු කම්කරුවාව නරුම ලෙස උත්කර්ෂනය කිරීමක් තුල වෘත්තීය සමිති නිලධාරීන්ට ධනපති පන්තියේ දේශපාලන නියෝජිතයන් සමග අතින'ත ගැනීමට ඉඩ ලබාදෙන හිස් වතාවතක් බවට පත්ව ඇත.

සඳුදා මිලවුකීහි දී ඔබාමා සමග එක්වූ ඒඑෆ්එල්-සීඅයිඕ සභාපති රිචඩ් ට්‍රැම්කා ඇතුලු මෙම සියලු චරිත කම්කරු පන්තියට එරෙහි පූර්න පරිමාන ප්‍රහාරයක නිරත ව සිටීය යන්න කිසිදු මවාපෑමකට සැඟවිය නො හැක.

ඇමරිකාව තුල දේශපාලනය සංලක්ෂනය කොට දැක්වෙන්නේ යෝධ රික්තයක් මගිනි. අද වනවිට වෙන කවරදාටත් වඩා ජනගහනයේ අනුපාතයක් නියෝජනය කරන කම්කරු පන්තියේ සමාජීය හා ආර්ථික ශක්තිය සහ එහි දේශපාලන ආනුභාවය අතර යෝධ විෂමතාවක් පවතී.

එක්සත් ජනපදයේ ඉතිහාසය පුරා ඇමරිකානු කම්කරුවෝ කැරලිකාරී පන්ති ගැටුම්වල නිරතව ඇති අතර ධනපති පන්තියේ බලවත් විරුද්ධත්වය මධ්‍යයේ සැලකිය යුතු සහන දිනාගැනීමට සමත්ව සිටිති. එහෙත් දේශපාලනිකව කම්කරු පන්තිය ඩිමොක්‍රටික් පක්ෂයටත් ඒ හරහා ධනේශ්වර පද්ධතියටත් ගැටගැසී පවතී. මෙම යටත් කිරීමේ ඵලවිපාක යලි වතාවක් ඔබාමා පරිපාලනය ප්‍රදර්ශනය කරමින් සිටී. විදේශීය සහ දේශීය යන එහි සියලු පිලිවෙත් මගින් එය සංගත සහ මූල්‍ය ප්‍රභූවේ අවශ්‍යතා ආරක්ෂා කොට ඇත.

වෘත්තීය සමිති සහ ඔබාමාගේ ලිබරල් සහායකයන්ගේ සිට "වාම" හෝ "සමාජවාදී" යයි කියාගන්නා ජාත්‍යන්තර සමාජවාදී සංවිධානය වැනි කන්ඩායම් දක්වා ඩිමොක්‍රටික් පක්ෂයට ඇති සහයෝගය දිරිගැන්වීමේ මං සෙවීමේ දිගට ම නිරතවන බොහෝ සංවිධාන තිබේ. එහෙත් අද වනවිට මෙම ප්‍රවනතාවලට කම්කරු පන්තිය මත ඇත්තේ අල්ප දේශපාලනික බලපෑමකි. යූඒඩබ්ලිව් සහ ඩිමොක්‍රටික් පක්ෂයේ විවිධ සහකාරක සංවිධානවල සම්පූර්න සහයෝගය සහිතව ඩිමොක්‍රටික් පක්ෂ සංස්ථාපිතය විසින් ඩිට්‍රොයිට්හි පසුගිය මාසයේ සංවිධානය කරන ලද "රැකියා" පෙලපාලියට තිබූ ඉතා සුලු සහභාගිත්වය මගින් මෙය ප්‍රදර්ශනය කරනු ලැබේ.

පන්ති අරගලය වර්ධනය වීම නො වැලැක්විය හැකි ය. දේශපාලන ජීවිතයේ පවත්නා රාමුවෙන් පිටත කම්කරු පන්තියේ නව මහජන අරගල වර්ධනය වනු ඇත. මෙම අරගලවලට නායකත්වය දීම සඳහා වඩාත් ම දැවෙන අවශ්‍යතාවය වන්නේ සංගත පාලිත ඩිමොක්‍රටික් සහ රිපබ්ලිකන් යන පක්ෂ දෙකට ම එරෙහිව සමාජවාදය සඳහා කරන අරගලය මත පදනම්ව කම්කරු පන්තියේ ස්වාධීන පක්ෂයක් ගොඩනැගීමයි.

ජෝ කිෂෝර් සහ ජෙරී වයිට්

© www.wsws.org